

# සන්නස කෙළිබිම

සංස්කරණය අසෝක සිල්වා

## ශ්‍රී ලංකා ක්‍රිකට් ඉතිහාසයේ නව පිටුවක් පෙරළූ නායකයා

### දෙබරවැවෙන් ආ සුරංග ලක්මාල්

සුරංග ලක්මාල් ශ්‍රී ලංකා ටෙස්ට් ක්‍රිකට් ඉතිහාසයේ නායකත්ව වාර්තා පොත අලුත් කළ නායකයා ය. ඒ වාර්තා වැදගත් වන්නේ දෙබරවැව වැනි දුරබැහැර ගමකින් පැමිණි ක්‍රීඩකයකු තැබූ වාර්තා නිසා ය. ඒවා දුෂ්කර ගමනක සැමරුම් ය.

සුරංග ලක්මාල් නායකයා ලෙස ශ්‍රී ලංකා කණ්ඩායම මෙහෙයවූ පළමු තරගය වූයේ බටහිර ඉන්දීය කොදෙව් කණ්ඩායමට එරෙහිව එතෙරදී පැවැත්වූ තරගයයි. නායකයා ලෙස කණ්ඩායම මෙහෙයවූ පළමු තරගයේදී ම එතෙර දී ජය ලැබීමේ වාර්තාව ඔහු හිමි කරගත්තේ ඒ තරගය ජයගැනීමෙන් ය.

ඉන්පසු ඔහු ශ්‍රී ලංකා කණ්ඩායම මෙහෙයවන්නේ ලෝකයේ ප්‍රභල කණ්ඩායමක් වන දකුණු අප්‍රිකා කණ්ඩායමට එරෙහිව ශ්‍රී ලංකාවේ පැවති ටෙස්ට් තරගාවලියේ දී ය. ඒ ඔහු නායකයා ලෙස මෙහෙයවූ  දෙවන හා තෙවන තරග වෙයි. අන්තර් ජාතික ක්‍රිකට් ශ්‍රේණිගත කිරීමේ දෙවන ස්ථානය හිමි කරගෙන සිටින ප්‍රබල දකුණු අප්‍රිකානු කණ්ඩායම මෙතෙර දී පරාජය කරමින් තරග මාලාවක් ජයගත් පළමු ශ්‍රී ලාංකික නායකයා වීමේ වාර්තාව සුරංග ලක්මාල් හිමිකරගත්තේ ගාල්ල ජාත්‍යන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ දී හා කොළඹ සිංහල ක්‍රීඩා සමාජ පිටියේ දී පැවති තරග දෙකම ජයගනිමින් ය. නිකම්ම ජයග්‍රහණ නොවේ. සුපිරි ජයග්‍රහණ දෙකකි. ශ්‍රී ලංකා ක්‍රිකට් කන්ඩායම නැවතත් ජයග්‍රහණයේ මාවතට ඇද දැමූ ජයග්‍රහණ දෙකකි.

ශ්‍රී ලංකාව ටෙස්ට් වරම් ලබා ගත් 1981/82 සිට 2018 දක්වා නායකයන් පහළොස් දෙනකු සිටි අතර  පළමු නායකයා වූ න්දුල වර්ණපුරගේ සිට දහසයවන (16) නායකයා බවට පත් වූ සුරංග ලක්මාල් දක්වා නායකයන් අතර වාර්තා පිහිට වූ නායකයෝ රැසක් සිටිති.

ලෝක කුසලානය ශ්‍රී ලංකාවට ගෙන ආ අර්ජුන රණතුංග ඇතුළු දුලීප් මෙන්ඩිස්, සනත් ජයසූරිය, කුමාර් සංගක්කාර ආදී නායකයන් ද සෝමචන්ද්‍ර ද සිල්වා, රංජන් මඩුගල්ලේ, අරවින්ද ද සිල්වා, හෂාන් තිලකරත්න, මාවන් අතපත්තු, මහේල ජයවර්ධන, කුමාර් සංගක්කාර, තිලකරත්න ඩිල්ෂාන්, ඇන්ජලෝ මැතිව්ස්, රංගන හේරත් හා දිනේෂ් චන්දිමාල් ආදී නායකයන්ද ගත් විට මේ නායකයන්ගෙන් බහුතරය අගනුවර ක්‍රිකට් ක්‍රීඩා කරන ප්‍රධාන පාසල් වන රාජකීය, සාන්ත තෝමස්, ආනන්ද, නාලන්ද, ඩී.එස්.සේනානායක, සාන්ත ජෝසප්, ආදී සුපිරි පාසල් විසින් බිහි කරන ලද නායකයන්ය.
අගනුවරින් බැහැර පාසල් බිහි කළ නායකයන් වූවත් ආවේ ක්‍රිකට් ක්‍රීඩාවට නම් දරූ පාසල් වලින් ය. සාන්ත සර්වේෂස්, මාතර (සනත්) ත්‍රිත්ව, මහනුවර (සංගක්කාර) ධර්මාශෝක, අම්බලන්ගොඩ (ඩී.එස්. ද සිල්වා  චන්දිමාල්,) මලියදේව, කුරුණෑගල (රංගන) ආදීන් මතකයට නැගෙයි.

අගනුවරින් බැහැර ප්‍රසිද්ධ පාසලක් නොවී නායකයත්වයට පත් වූයේ කලූතර මහා විද්‍යාලයේ ටී.එම්. ඩිල්ෂාන් පමණකි. එහෙත් 2018 වර්ෂයේ නායකත්ව වරම් ලබමින් කණ්ඩායමට නායකත්වය දුන් පළමු ටෙස්ට් තරග දෙකෙහි දීම ජය ලැබූ ප්‍රථම ශ්‍රී ලාංකීය ක්‍රිකට් නායකයා වන්නේ සුරංග ලක්මාල්ය.

ඔහු ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකු වූවත්, ක්‍රිකට් ක්‍රීඩාවේ හපන්කම් පෙන්වන පළමු පාසල වන්නේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දෙබරවැව ජාතික පාසලයි. සුරංග 17 න් පහළ ක්‍රිකට් කණ්ඩායම නියෝජනය කරන්නේ දෙබරවැව ජාතික පාසලේ දීය. ඈත දුෂ්කර ගමක සිට ගාලූ අගනගරයට පැමිණ, පසුව කොළඹ ප්‍රධාන පෙළේ ක්‍රීඩා සමාජයක් වන ටැමිල් යූනියන් සාමාජිකයකු වෙමින් සුරංග ලක්මාල් , නායකයා වූ පළමු ටෙස්ට් තරග දෙකම ජය ලබන්නේ වාර්තා රැසක් ද පිහිටුවමිනි.

ලක්මාල්ගේ ක්‍රිකට් ජීවිතයේ පළමු වාර්තාව ඔහු හිමි කර ගන්නේ, නව ක්‍රීඩාංගණයක ටෙස්ට් තරගයක දී පළමු පන්දුවෙන්ම කඩුල්ලක් දවා ගත් ලොව තුන්වැනි පන්දු යවන්නා බවට පත් වෙමිනි.

සුරංගගේ පළමු පන්දුවට ගොදුරු වී ක්‍රීඩාගාරයට ගියේ ලොව සුපිරි ආරම්භක පිතිකරුවකු වන බටහිර ඉන්දීය කොදෙව් ක්‍රීඩාක ක්‍රිස් ගේල්ය. සුරංගගේ පන්දු යැවීමේ මෙම වාර්තාවට මීට පෙර හිමිකම් කීවෝ ඉන්දියාවේ කපිල්දේව් හා පකිස්තානයේ ඉම්රාන් ඛාන්ය. සුරංග ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාවට අමිල ආයෝජනයක් බව ටෙස්ට් වරම් ලද පළමු තරගවලින්ම ඔප්පු කොට සිටියේය.

සුරංග ලක්මාල්, ක්‍රිකට් ප්‍රේක්ෂකයන් නැවත ක්‍රිකට් බලන්නට කැඳවූවා යයි කිවොත් නිවැරදි ය. ප්‍රේක්ෂකයන් නැවතත් රූපවාහිනී යන්ත්‍ර ඉදිරියට ගෙන ආ සුරංග ලක්මාල් ප්‍රමුඛ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම ශ්‍රී ලංකා ටෙස්ට් ක්‍රිකට් ඉතිහාස පොතේ අලුත් පරිච්ඡේදයක් පටන්ගත්තා යයි කීවොත් නිවැරදි ය.

**බුද්ධදාස ගලප්පතිගේ සටහනක් ඇසුරිනි**

From Page 26

ships scrutinised without bias, prejudice, racial and ethnic divisiveness. I have seen how the world has been torn apart by war, violence, displacement, victimisation, minoritarianism, all the disruptive elements that cause insurmountable barriers of separation, divisiveness, hatred, bias, prejudice. We need to respect each other's cultures and ways of life and thought – manmade barriers that cause alienation and separation, the annulment of diverse viewpoints, the creation of ethnicity and mental territorialisation, victimisation, the imprisonment of the spirit that makes the mind captive through repression, political or otherwise, leading to violence and radical movements.

# Nallur

by Jean Arasanayagam

It's there,
beneath the fallen fronds, dry crackling
piles of broken twigs abandoned wells of brackish
water lonely dunes
it's there
the shadows of long bodies shrunk in death
the leeching sun has drunk their blood and
bloated swells among the piling clouds
it's there,
death,
smell it in the air
its odour rank with sun and thickening blood
mingling with fragrance from the frothy toddy
pots mingling like lolling heads from
blackened gibbets,
it's there
amid the clangour of
the temple bells, the clapping hands, the
brassy clash of cymbals,
the zing of bullets
cries of death
drowned in the roar
of voices calling Skanda
by his thousand names
Murugan, Kartikkeya
Arumugam … …
"We pray, we cry, we clamour
oh Sri Kumaran, be not like the god
who does not hear, deaf Sandesveran."

Thirtham now no longer nectar of the gods
brims over but is bitter, bitter,
and at the entrance to Nallur
the silent guns are trained
upon a faceless terror
Outside,
the landscape changes
the temples by the shore are smoking
ruins charred stone blackened,
on empty roads are strewn
the debris of warfare,
stained discarded dressings
burnt out abandoned vehicles
a trail of blood
soon mopped up by the thirsty sun
Turned away, from bloody skirmishes
of humankind, the gods are blinded
by the rain of bullets,
six faced Arumugam
all twelve eyes
close in darkness
The land is empty now
the pitted limestone
invaded by the sea
drowns, vanishes,
waves of rust swell and billow
beating into hollow caves and burial urns
filled with the ash of bodies
cremated by the fire of bullets.



*Jean Arasanayagam is a lecturer in English at the Government Teachers' College, Peradeniya. She has published several volumes of poetry, and her work is well known in Sri Lanka.*